**මාධ්‍ය ප්‍රවණතා**

## මුද්‍රිත මාධ්‍යයට අභියෝගයක්

# අන්තර්ජාලය ද?

''නිවැරදි ඉලක්කයට යොමු කළ ඕනෑම මාධ්‍ය නිෂ්පාදනයකට හොඳ වෙළෙඳ පොළක් ඇත. පත්තර පිටුවකින් කිසිවක් කියවා අවබෝධ කර ගැනීම යල් පැන ගිය බවට හෝ මෝස්තරයක් නොවන බවට හෝ සාක්කි සොයා ගත නොහැකි ''නැෂනල් පෝස්ට්'' පුවත්පත හිමි හොලිංජර් ඉන්ටනැෂනල් සමාගමේ සභාපති කොන්රාඩ් බ්ලැක් පවසයි.

අන්තර්ජාලය සෙසු මාධ්‍යයන් අභිබවා ගොස් සිටින බවට අද තර්කයක් නොමැත. පුවත්පත් ගුවන්විදුලිය සහ රූපවාහිනිය අන්තර්ජාලයේ දැඩි ග්‍රහණයට පත්වී හමාර ය. පාඨකයෝ තමන් කැමති බොහෝ පුවත්පත් සහ සඟරා අන්තර්ජාලය මඟින් කියවති. ගුවන්විදුලියට සවන්දීම සහ රූපවාහිනිය නැරඹීම ද ඔවුනට අන්තර්ජාලය මඟින් ම කළ හැකි ය. පුවත්පත්, ගුවන්විදුලි සහ රූපවාහිනී අන්තර්ජාල වෙබ් අඩවි බොහොමයක්ම සේවා සපයන්නේ නොමිලයේය. එය පාඨකයනට ලොකු වාසියකි.

එහෙත් අන්තර්ජාලයට ද සීමා ඇත. අන්තර්ජාලය කෙතරම් ව්‍යාප්තවුවත් කිසියම් මාධ්‍යයක ඇති විශ්වසනීයත්වය බිඳ දමා එයට ඉදිරියට යා නොහැකිය. කිසියම් මාධ්‍යයක් ගැන පාඨකයා තුළ ඇති විශ්වාසය බිඳ දැමීමට අන්තර්ජාලයට නුපුළුවන. අන්තර්ජාලය හරහා පමණක් පළ කෙරෙන ඔන්ලයින් පුවත්පත් වලද හොඳ විශ්වසනීයත්වයක් තිබිය යුතුය. වැඩි විශ්වාසයක් හෝ පිළිගැනීමක් නොමැති වෙබ් අඩවිවලට පිවිසීමට වඩා හොඳ විශ්වසනීයත්වයක් රැක ගෙන ඇති මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය වෙබ් අඩවි වලට පිවිසීමට පාඨකයෝ වැඩිපුර කැමති වෙති. එවැනි වෙබ් අඩවි අතර "ලන්ඩන් ටයිම්ස්", "ටයිම්", සහ "බී.බී.සී." මුල් තැන ගනියි.

දුරකතන සහ අන්තර්ජාල පහසුකම් ප්‍රමාණවත් ලෙස ව්‍යාප්තවී නැති ශ්‍රී ලංකාව වැනි දියුණුවන රටවලට ඉහත සඳහන් කරුණු එතරම් අදාළ නැත. එහෙත් ඇමරිකාව, කැනඩාව වැනි දියුණු රටවලින් ඒ සඳහා උදාහරණ සපයා ගත හැකියි.

"යූ.ඇස්.ඒ.ටුඩේ" සහ "වෝල් ස්ට්‍රීට් ජර්නල්" වැනි රටපුරා ව්‍යාප්ත වී ඇති පුවත්පත් හැර ඇමරිකාවේත් කැනඩාවේත් පුවත්පත් පළ කෙරෙන්නේ කිසියම් නිශ්චිත සීමිත ප්‍රදේශයක් සඳහා පමණි. මෙවැනි පුවත්පත් කිසියම් නගරයක් සඳහා පළ වන පුවත්පත යන අරුත ඇති "සිටි/ටවුන් පේපර්ස්"යනුවෙන් හැඳින්වෙයි. මෙම නාගරික පුවත්පත් වලට බොහෝවිට තරගකරුවන් නොමැත. ඒ නගරවල එම පුවත්පත් සඳහා පවතින්නේ ඒකාධිකාරියකි.

එම පුවත්පත්වලට තම නගරයේ තරගකරුවන් නැතත් බාහිර තරගකරුවෝ බෙහෝය. පොදුවේ හැම පුවතක්ම පළ කරන "යූ.ඇස්.ඒ.ටුඩේ" ඇමරිකාවේ එකම ජාතික පුවත්පතයි. දිනපතා පිටපත් 16,53,000 කට වැඩියෙන් අළෙවි වන එම පුවත්පතත් වෙළඳ සහ මූල්‍ය පුවත් පළ කරන "වෝල් ස්ට්‍රීට් ජර්නල්" පුවත්පතත් ඇමරිකාවේ හැම නගරයකම විකිණෙයි.

රූපවාහිනිය ද නාගරික පුවත්පත්වල ප්‍රබල තරගකරුවෙකි. ප්‍රාදේශීය නාලිකාවලට අමතරව ජාතික නාලිකා කිහිපයක්ම ප්‍රවෘත්ති සහ අනෙකුත් වැඩ සටහන් ප්‍රචාරය කරයි.

නාගරික පුවත්පත්වල අලුත්ම තරගකරුවා අන්තර්ජාලයයි. ඇමරිකාවේ සහ කැනඩාවේ හැම නිවසකම පාහේ දුරකතන පහසුකම් ඇත.ඒ නිවෙස් ඉතා වැඩි ගණනක අන්තර්ජාල පහසුකම් ද තිබේ.

ඇමරිකාවේත් කැනඩාවේත් නාගරික පුවත්පත් පළ කරන්නන්ගේ මන්දෝත්සාහීභාවය සහ ප්‍රබල තරගකරුවන්ගේ අභියෝගය මධ්‍යයේ වුවත් හොඳ පුවත්පතක් පළ කර සාර්ථක ලෙස පවත්වාගෙන යැමට ඇමරිකාවේත් කැනඩාවේත් තවමත් ඉඩකඩ තිබේ ඒ සඳහා දිය හැකි හොඳම උදාහරණය 1998 වසර අග භාගයේදී කැනඩාවේ අරඹන ලද 'නැෂනල් පෝස්ට්' පුවත්පතයි. මෙම පුවත්පත අරඹා ටික දිනක් ඇතුළත පුවත්පත සඳහා වාර මුදල් ගෙවූ පාඨකයන්ගේ සංඛ්‍යාව තුන් ලක්ෂය දක්වා ඉහළ ගියේය.

'නැෂනල් පෝස්ට්' පුවත්පතට මෙම සාර්ථකත්වය ලබා ගැනීමට හැකිවූයේ එම පුවත්පත කැනඩාවේ වෙනත් පුවත්පත් පළ කරන රටාවෙන් වෙනස්වීම නිසාය.

කැනඩාවේ මාධ්‍ය සාමාන්‍යයෙන් මඳක් වමට නැඹුරුය. එරට මාධ්‍ය ආයතන හිමියනුත් මාධ්‍යවේදීනුත් ඇමරිකාවත් කැනඩාවත් අතර වැඩි වෙනසක් නොදකිති. කැනඩා පුවත්පත් ඕනෑම ප්‍රශ්නයක් ගැන අදහස් ඉදිරිපත් කරන්නේ බෙහෙවින් නැන්පත් අයුරිනි.

එහෙත් "නැෂනල් පෝස්ට්" පුවත්පත එහි ප්‍රවෘත්ති", විශේෂාංග සහ කතුවැකි තියුණු ස්වරූපයකින් ඉදිරිපත් කරයි. එහි ලිවීමේ ශෛලිය වඩාත් චතුරය. එය තුළ සැහෙන පමණ හාස්‍යය ගැබ්වී ඇත. පිටු සැකසීමද සිත් ගන්නාසුළුය.

"නිවැරදි ඉලක්කයට යොමු කළ ඕනෑම මාධ්‍ය නිෂ්පාදනයකට හොඳ වෙළෙඳ පොළක් ඇත. පත්තර පිටුවකින් කිසිවක් කියවා අවබෝධ කර ගැනීම යල් පැන ගිය බවට හෝ මෝස්තරයක් නොවන බවට හෝ සාක්කි සොයා ගත නොහැකි "නැෂනල් පෝස්ට්" පුවත්පත හිමි හොලිංජර් ඉන්ටනැෂනල් සමාගමේ සභාපති කොන්රාඩ් බ්ලැක් පවසයි. හොලිංජර් ඉන්ටනැෂනල් සමාගම ලන්ඩන් නුවර 'ටෙලිග්‍රාෆ්' චිකාගෝ නුවර 'සන්- ටයිම්ස්' සහ ඊශ්‍රායලයේ 'ජෙරුසලම් පෝස්ට්' යන පුවත්පත් වලද හිමිකරුවන්ය.එම පුවත්පත් වලට විශාල අළෙවියක් ඇත.

"පාඨකයනට පුවත්පත රූපවාහිනී තිරයෙන් (මොනිටරයෙන්) බලා ගැනීමට ඉඩ නොහැර. ඔවුන් කියැවීමට කැමති පුවත් සහ ලිපි ඔවුන් කැමති වේලාවක කියැවීමට ඉඩකඩ සැලසෙන අයුරින් පුවත්පත අතේ ගෙන යා හැකි ලෙස මුද්‍රණය කර ඉදිරිපත් කිරීමේ ක්‍රමය නව කලක් යන තෙක් අප අතර රැඳී පවතිනු ඇත. අවශ්‍ය වන්නේ පුවත් සහ ලිපි ප්‍රාණවත් ලෙස ලියා සිත් ගන්නා ලෙස ඉදිරිපත් කිරීම යැයි" බ්ලැක් පවසයි.

බ්ලැක්ගේ මතයට අනුව අන්තර්ජාලයෙන් වැඩිම තර්ජනය එල්ල වී ඇත්තේ පුවත්පතට නොව රූපවාහිනියටයි. අන්තර්ජාලයත් රූපවාහිනියත් සංඛ්‍යාත පිළිබඳ ප්‍රශ්නය ඉදිරි වසර කිහිපය තුළ විසඳ ගැනීමෙන් පසුව රූපවාහිනියත් අන්තර්ජාලයත් එකම තිරයකින් නැරඹිය හැකි වනු ඇත. කෙනෙකුට නැරඹිය හැකි අන්තර්ජාල වෙබ් අඩවි සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වෙද්දී රූපවාහිනිය නැරඹීම පහත වැටී ඇතැයි සංඛ්‍යා ලේඛන පෙන්වා දී ඇත. කෙසේ වෙතත් පුවත්පත්වලට තම අළෙවිය වැඩි කර ගැනීම පිණිස අන්තර්ජාලය යොදා ගත හැකිය. එය කළ හැක්කේ පුවත්පත් කුඩා පෙදෙසකට සීමාවී නොසිට විශාල ප්‍රදේශයක් තුළ තරග වැදීමෙනි. ඒ මඟින් පුවත්පත් නිෂ්පාදනයේ දී වැය වන අමු ද්‍රව්‍යවල මිල බොහෝ සෙයින් අඩු කර ගත හැකි යැයි හොලිංජර් ඉන්ටර්නැෂනල්හි සභාපතිවරයා කියයි. ❑